## කවරයේ කතාව -2

# ලෝක නායකයන් රත් කළ

පෘථිවිතලයේ උණුසුම ඉහළ නංවන වායු වර්ග අවකාශයට මුදා හැරීම සීමා කිරීම සම්බන්ධයෙන් 1997 දී පිඹුරුපත් සැකසුණු 'කියෝතෝ සන්ධානය' සම්බන්ධයෙන් යහපත් ආකල්පයක සිටි ඇ. එ. ජනපදය අද එහිලා දක්වන අලස ප්‍රතිපත්තිය, පසුගිය කාලයේ ලොව පුරා මහත් ආන්දෝලයක් ඇති කළේ ය.

වසර 2000 නෙදර්ලන්තයේ හේග් නුවර පැවැති සම්මේලනයේදී මතුවුණු අර්බුදයක් මත තීරණයක් නොමැතිව කල් දමුණු සමුළුව මේ වසරේ ජූලි මාසයේදී රැස්වීමට නියමිතව ඇත්තේ පාරිසරික වශයෙන් ඉතාමත් වැදගත් වූත් තීරණාත්මක වූත් ඉහත ගැටලුවට නිශ්චිත පිළිතුරක් සෙවීම සඳහා 'කියෝතෝ සන්ධානය' සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළඹීමේ අටියෙනි.

> සංවර්ධිත රටවල් පමණක් මේ නීතියට යටත් කිරීමට තීරණය කරනු ලැබුවේ, දැනට වායුගෝලයට මුදාහැරෙන කාබන්ඩයොක්සයිඩ් පරිමාවෙන් විශාලතම කොටස සංවර්ධිත රටවලින් වායුගෝලයට එක්වීම නිසා යි. සංවර්ධනය වෙමින් පවතින රටවල් තම සංවර්ධන ක්‍රියාදාමය ඉදිරියට ගෙනයාම වඩාත් වැදගත් නිසා ඒවාට සීමා පැනවිය නොහැකි විය.

"කියෝතෝ සන්ධානය" පිහිටුවා ගැනීමට අඩිතාලම වැටුණු ආකාරය මෙහිදී විමසා බැලීම වටී.

1992 වසරේ බ්‍රසීලයේ රියෝ දී ජැනීරෝ නුවර දී මිහිකත සමුළුව (Earth summit) රැස් වූ අවස්ථාවේ ගෝලීය වෙනස්වීම් (පාරිසරික) පිළිබඳව විශේෂයෙන් සලකා බැලිනි.

ගෝලීය වශයෙන් වැදගත් පාරිසරික ගැටලු තුනක් පිළිබඳව එහිදී සාකච්ඡාවට ලක් විය. එනම්

1. ඕසෝන් ස්ථරය ක්ෂය වීම
2. අන්තර් සීමා (රටවල් අතර) වායුගෝලීය දූෂණය සහ
3. දේශගුණික විපර්යාස යි.

මෙහි දී දේශගුණික විපර්යාස අද ලොව මුහුණ පා ඇති ප්‍රධානතම ගැටලුවක් ලෙස සාකච්ඡාවට බඳුන් විය. එම සාකච්ඡා තුළින්, "දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියට" (UNFCCC) එළඹිණි.

1988 දී පත් කරනු ලැබූ විද්‍යාඥයන්ගෙන් සැදුම්ලත් දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර්ජාතික අනු කමිටුවේ දෙවැනි සමාලෝචන වාර්තාවේ දී ලොව දේශගුණ විපර්යාස පිළිබඳ කරන ලද අනතුරු හැඟවීම් "දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත සම්මුතියට (UNFCCC) එළඹීමට බෙහෙවින් හේතු වූවා යැයි කීම නිවැරදි ය.

මෙම සම්මුතියට (UNFCCC) එළඹීමේ මූලික අරමුණ වූයේ දේශගුණ විපර්යාස වැළැක්වීම සඳහා ස්වේච්ඡා ක්‍රියාමාර්ග ගැනීම යි.

මෙහි දී අප නිරතුරුව ම කතාබහට ලක් කළ, දේශගුණික විපර්යාස යනු මොනවා ද?

"මිනිසාගේ ක්‍රියාකාරිත්වයට, කෙළින් ම හෝ වක්‍රව සම්බන්ධ කටයුතු නිසා පරිසරයට මුදා හැරෙන හරිතාගාර වායූන් මගින් සිදු වන අධි හරිතාගාර ආවරණය හේතුවෙන් දේශගුණයේ සිදුවන විපර්යාස" මේ නයින් හඳුන්වමු.

# කියෝතෝ සන්ධානය

*'කියෝතෝ සන්ධානයේ" ඉලක්ක සපුරා ගැනීමට නම් සංවර්ධිත රටවලට විශාල වියදමක් දැරීම සිදු වේ. මේ වියදම අඩු කර ගැනීම සඳහා සංවර්ධනය වන රටවලට දැයක විය හැකි ක්‍රමයක් කියෝතෝ සන්ධානය තුළම සඳහන් වේ. එනම් පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය යි. ඉන් කියැවෙන්නේ සංවර්ධිත රටක් විසින් සංවර්ධනය වෙමින් පවතින රටක ආයෝජනය (වනාන්තර වැවීම ආදිය) මගින් තමන් විසින් අඩු කළ යුතු කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණයේ ඉලක්කය සපුරා ගැනීමට උදව් ලබා ගැනීම ය.*

පරිසර සහ වන සංරක්ෂණ අමාත්‍යාංශයේ සහකාර ලේකම්

**එම්.එම්.එස්.එස්.බී. යාලේගම**

වර්තමාන හා මතු පරපුරේ අභිවෘද්ධිය තකා මෙකී දේශගුණික විපර්යාස වැළැක්වීම කාලීන අවශ්‍යතාවක් වුවත්' UNFCCC' ස්වේච්ඡා ක්‍රියාමාර්ග පමණක් ඒ සඳහා ප්‍රමාණවත් නොවී ය. එබැවින් 'UNFCCC' පාර්ශ්වකරුවන්, තුන්වැනි වරට, 1997 දෙසැම්බර් මස ජපානයේ කියෝතෝ නුවර දී රැස් වූ අවස්ථාවේ දී "දේශගුණ විපර්යාස වැළැක්වීම සඳහා නීතිමය පියවර අඩංගු සංධානයක්" පිළිගුවා ගැනීමට තීරණය කරන ලදී. ඒ වාර්තාව "කියෝතෝ සන්ධානය" යි. (මෙයට "සන්ධානය" යනුවෙන් අනිවාර්යයෙන් ම භාවිත කළ යුතු වන්නේ එයට නීතිමය බැඳීමක් ඇති නිසායි. "සම්මුතියක්" යනුවෙන් අප හඳුන්වන්නේ නීතිමය බැඳීමක් නොමැති ක්‍රියාමාර්ගයන් සඳහා යි.)

සංවර්ධිත රටවලට "කියෝතෝ සන්ධානය" තුළින් සුවිශාල ඉලක්කයක් පැවරිණි. එනම් වසර 2000-2012 අතර අවුරුදු පහක කාල සීමාව තුළ දී වායුගෝලයට මුදාහැරෙන කාබන්ඩයොක්සයිඩ් $(Co_2)$ පරිමාවේ සාමාන්‍ය 1990 දී ඔවුන් මුදාහල ප්‍රමාණයෙන් සියයට 5.2 කින් අඩු කළ යුතු වීම යි. මෙය සමීකරණයක් ලෙස දක්වතොත්

$$\frac{\text{(2008-2012) මුදාහරින } Co_2 \text{ ප්‍රමාණය}}{5} = \text{1990 දී මුදාහල } Co_2 \text{ ප්‍රමාණය} \times \frac{94.8}{100}$$

සංවර්ධනය වෙමින් පවතින රටවලට මෙහිලා සීමාවක් නොපැනවිණි. සංවර්ධිත රටවල් පමණක් මේ නීතියට යටත් කිරීමට තීරණය කරනු ලැබුවේ, දැනට වායුගෝලයට මුදාහැරෙන කාබන්ඩයොක්සයිඩ් පරිමාවෙන් විශාලතම කොටස සංවර්ධිත රටවලින් වායුගෝලයට එක්වීම නිසා යි. සංවර්ධනය වෙමින් පවතින රටවල් තම සංවර්ධන ක්‍රියාදාමය ඉදිරියට ගෙනයාම වඩාත් වැදගත් නිසා ඒවාට සීමා පැනවිය නොහැකි විය.

මෙහිදී සංවර්ධිත රටවල් අතරින් ද රටවල් කීපයක් සියයට 5.2 කට වැඩි ඉලක්කයකට ලැබිණි. යුරෝපා සංගමයට අයත් රටවල් සියයට 8 කින් ද, ඇමරිකා එක්සත් ජනපදය සියයට 7 කින් ද, ජපානය සියයට 6 කින් ද වායුගෝලයට මුදාහැරෙන කාබන්ඩයොක්සයිඩ් පරිමාව අඩු කළ යුතු බවට කියෝතෝ සන්ධානයේ සඳහන් කෙරේ.

මෙහිදී ඇමරිකා එක්සත් ජනපදයට ඉහළ ම ඉලක්කයක් පනවා ඇත්තේ අද ලොව ප්‍රධානතම පරිසර දූෂකයා බවට ඇමරිකාව පත් වී ඇති නිසා යි. ලොව රටවල් අතරින් ඒක පුද්ගල මුදා හැරීම (එක පුද්ගලයකු පිටකරන ප්‍රමාණය) වැඩි ම රට ද ඇමරිකාව වන අතර, එය ආසියානු කලාපයේ නේපාලය වැනි රටක් සමග ගත් විට 270 ගුණයක් ඉහළ ය.

'කියෝතෝ සන්ධානයේ" ඉලක්ක සපුරා ගැනීමට නම් සංවර්ධිත රටවලට විශාල වියදමක් දැරීම සිදු වේ. මේ වියදම අඩු කර ගැනීම සඳහා සංවර්ධනය වන රටවලට දායක විය හැකි ක්‍රමයක් කියෝතෝ සන්ධානය තුළම සඳහන් වේ. එනම් පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය යි."(CDM). ඉන් කියැවෙන්නේ සංවර්ධිත රටක් විසින් සංවර්ධනය වෙමින් පවතින රටක ආයෝජනය (වනාන්තර වැවීම ආදිය) මගින් තමන් විසින් අඩු කළ යුතු කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණයේ ඉලක්කය සපුරා ගැනීමට උදව් ලබා ගැනීම ය.

උදාහරණයක් ගතහොත් ඇ. එ. ජනපදය තුළ කාබන්ඩයොක්සයිඩ් මෙ. ටෝ. 1 ක් අඩු කිරීමට වැය කළ යුතු මුදලට වඩා අඩු මුදලක් වැය කිරීමෙන් සංවර්ධනය වෙමින් පවතින රටක් තුළ දී එම කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය ම අඩු කිරීමේ හැකියාව ඇත.

මෙහි දෙපසට ම ඇති වාසිය නම් සංවර්ධිත රටවල් අඩු වියදමකින් තමන් විසින් අඩු කළ යුතු කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය අඩු කරන අතරම සංවර්ධනය වෙමින් පවතින රටට මුදල් සමග තාක්ෂණය ද ලැබීම යි.

ඒ හැරුණු විට මෙම සන්ධානයෙහි එන (Emmition Trading) විමෝචන කාරක අලෙවිය සහ ඒකාබද්ධ කාර්ය සාධනය (Joint Implimentation) යන යාන්ත්‍රණ ඔස්සේ සංවර්ධිත රටවල් දෙකකට ගනු දෙනු කිරීමේ අවස්ථාව උදා වේ.

කරුණු කෙසේ වෙතත් අද "කියෝතෝ සන්ධානය" ක්‍රියාත්මක වේ ද නැත් ද යන අවදානමට මුහුණ පා ඇත්තේ ලොව ප්‍රධානතම පරිසර දූෂකයා වන ඇමරිකාවේ, ජනාධිපතිවරයා විසින් එය "මැරුණු සන්ධානයක්" ලෙස ප්‍රකාශයට පත් කිරීමත් එය ක්‍රියාවට නැංවීම ඇමරිකානු ආර්ථිකයට අසුබ නිමිත්තක් වන බවට ප්‍රකාශ කිරීමත් නිසා ය.

මුලින් ම මෙහිලා එකඟතාවක් පළ කර සිටි ඇමරිකානු ජනාධිපතිවරයාගේ වෙනස් වීමට වසර 2000 නෙදර්ලන්තයේ හේග් නුවර පැවති සම්මේලනයේ දී ඇ. එ. ජනපදය හා යුරෝපා සංගමය අතර ඇති වූ අර්බුදකාරී තත්ත්වය හේතු විය. මෙහිදී අර්බුදය මතු වූයේ කාබන්ඩයොක්සයිඩ් උරා ගන්නා ප්‍රභවයන් සම්බන්ධව යි. විශේෂයෙන් ම වනාන්තර සම්බන්ධව ය. කියෝතෝ සන්ධානයේ ඉලක්ක සපුරා ගැනීමේදී කාබන්ඩයොක්සයිඩ් අවශෝෂකයක් වශයෙන් වනාන්තර යොදා ගැනීමට ඇමරිකාවට අවශ්‍ය විය. එසේ ම පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය ඔස්සේ සංවර්ධනය වන රටවල ආයෝජනය වැඩි කර ගැනීම (වනාන්තර වැවීම) මගින් තමන්ට වැය වන වියදම අඩු කර ගැනීම ඔවුන්ගේ අභිප්‍රාය විය

එහෙත් යුරෝපා සංගමය පවසා සිටියේ ඔවුන් ඇමරිකාව තුළම ක්‍රියාත්මක වීම මගින් ගුවනට මුදා හැරෙන කාබන්ඩයොක්සයිඩ් වැඩි ප්‍රමාණයක් අඩු කළ යුතු බව ය. මේ හේතුව මත ගැටුමක් මතු වුණු අතර එකඟතාවකින් තොරව හේග් සමුළුව විසිරී ගියේ ය.

කෙසේ වෙතත් මේ වසරේ ජර්මනියේ බොන් නගරයේ රැස්වන සමුළුවට පැමිණීමට නියමිත සංවර්ධනය වන රටවල කණ්ඩායම (77 කණ්ඩායම) හා චීනය පවසා සිටින්නේ "කියෝතෝ සන්ධානය" නැවත සාකච්ඡා කර වෙනස් කළ යුතු නැති බව යි. මේ අතර ඇ. එ. ජනපදය මේ සඳහා නම්මවා ගැනීමට අන්තර්ජාතික ප්‍රජාව දැනට ලොකු උත්සහයක් දරමින් සිටී.

පසුගියදා නිකුත්වූ ඇමරිකානු ජාතික සහයෝගිතා වැඩ සටහනේ වාර්තාවකින් පෙන්වා දෙන්නේ 2001 අප්‍රේල් 23 ද ඇමරිකාවේ සිදු කළ

ජනමත විමසුමකට අනුව, පක්ෂ වශයෙන් ගත්ත ද, වයස් කාණ්ඩ අනුව ගත්ත ද, ආදායම හෝ අධ්‍යාපන අතින් ගත්ත ද, සියයට 50 කට වැඩි ඇමරිකානු ජාතිකයන් පිරිසක් කියා සිටින්නේ කියෝතෝ සංධානයට ඔවුන්ද එකතු විය යුතුය යන අදහස බව යි. ශ්‍රී ලංකාව ද තවමත් "කියෝතෝ සන්ධානයට අත්සන් තබා නැත. "පවිත්‍රතා සංවර්ධන යාන්ත්‍රණය සම්බන්ධව" ශ්‍රී ලංකාවේ පිළිවෙත කුමක් විය යුතු ද යන්න තීරණය කිරීම උදෙසා විද්වතුන්ගේ අදහස් ලබා ගනිමින් අධ්‍යයන කටයුතු කිරීම පරිසර අමාත්‍යාංශය මගින් මේ දිනවල සිදු කෙරෙමින් පවතී. කෙසේ වුවද "කියෝතෝ සන්ධානය" තවමත් එක්තරා රාමුවකට පමණක් සීමා වී පවතී. එහිලා අවසාන තීරණයක් ගැනීමට මෙවර සමුළුවේ දී නියමිත වුව ද නිශ්චිත අදහසක් ප්‍රකාශ කිරීම උගහට ය. ඇතැම් විට එය සංශෝධන සහිතව අත්සන් තැබීමට හෝ ඉවතට විසි වීමට ද ඉඩ ඇත. ❑

**සාකච්ඡා කළේ**

**ලලනි මායාදුන්න**